# රණවිරු අයදුම්කරුවන් හට ඉඩම් කොටස් ලබාදීම සඳහා තෝරාගැනීමේ ක්‍රියා පටිපාටිය

* මෙම තෝරාගැනීමේ ක්‍රමවේදයේදී රණවිරු පදනම මත උපරිම ලකුණු 50ක් සහ වෙනත් අදාළ කරුණු සඳහා උපරිම ලකුණු 50ක් ලෙස ලකුණු ලබාදෙයි.

* මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගෙන් ලකුණු 30 කට වඩා ලබාගන්නා සියලු අයදුම්කරුවන් හට ඉඩම් කොටස් ලබාදීම සුදුසු වේ. (මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වන අයදුම්කරුවන් හට රණවිරු පදනම මත ලබාදෙන ලකුණු ලබාගත නොහැකි වන හෙයින්)

* ඉහත අයුරින් මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හට ඉඩම් කොටස් ලබාදුන් පසු බෙදාදීමට ඉතිරිව ඇති ඉඩම් කොටස් ප්‍රමාණය අනෙකුත් අයදුම්කරුවන්ගෙන් වැඩිම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් හට ලබාදීම සුදුසු වේ.
(ලකුණු 40 ට වඩා ලබාගන්නා අයදුම්කරුවන්ට පමණක් ඉඩම් ලබාදිය යුතුය.)

* ඉහත ආකාරයට කඩයිම් ලකුණු මට්ටම් අනුව පළමුව ඉඩම පිහිටි ප්‍රා.ලේ. කොට්ඨාසයේ අයදුම්කරුවන්ට ඉඩම් ලබාදී ඉතිරි ඉඩම් කොටස් ප්‍රමාණය කඩයිම් ලකුණු මට්ටම් අනුව ආසන්න ප්‍රා.ලේ. කොට්ඨාසවල අයදුම්කරුවන්ට බෙදාදිය යුතු වේ.

* ඉඩම් කච්චේරි සඳහා කැඳවීමේදී අයදුම්කරුවන් වෙතින් පහත සඳහන් ලේඛන සහ ලිපි පිටපත් ගෙන්වාගෙන පරීක්ෂා කිරීමෙන් මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හට මෙන්ම ලකුණු ලබාදීමේ පිළිවෙලට අනුව තෝරාගන්නා අයදුම්කරුවන් හට ඉඩම් කොටස් ලබාදීමට සුදුසුකම් තිබේදැයි යන්න සනාථ කරගැනීම සඳහා යොදාගත හැකිය. ඒ අනුව පහත සඳහන් ලේඛන රැගෙන එන ලෙස අයදුම්කරුවන් දැනුවත් කළ යුතුය.

(1) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත හෝ අදාළ හඳුනාගැනීමේ සහතිකයක්

(2) රණවිරුවා මියගිය අයෙකු නම් ඒ බව සනාථ කළ හැකි ලිපියක පිටපතක්

(3) අයදුම්කරු මියගිය රණවිරුවකුගේ ළඟම ඥාතියකු නම් අයදුම්කරු මියගිය රණවිරුවාගේ ළඟම ඥාතියා බව සනාථ කිරීමට හැකි ලිපියක පිටපතක්

(4) ආබාධිත රණවිරුවකු නම් ආබාධිත බව සහ ආබාධිත ප්‍රතිශතය සඳහන් කර ඇති ලිපියක පිටපතක්

(5) ක්‍රියාන්විත සේවා කාලය හා දැනට සම්පූර්ණ කර ඇති සේවා කාලය වෙන වෙනම සඳහන් කර ඇති සේවා සහතිකයක්

(6) විශ්‍රාමික රණවිරුවකු නම් විශ්‍රාමික බව සනාථ කළ හැකි ලිපියක පිටපතක්

(7) විවාහක අයදුම්කරුවකු නම් විවාහ සහතිකයේ පිටපතක්

(8) අයදුම්කරුගේ කලත්‍රයා ස්ථිර රැකියාවක නිරත වේ නම් එම ආයතනයෙන් ලබාගත් සේවා සහතිකයක්

(9) සන්නද්ධ සේවාවන්හි සේවයේ නියුතුව සිටි හෝ දැනට සේවයේ යෙදී සිටින අයදුම්කරුගේ පවුලේ වෙනත් ආසන්න සාමාජිකයන් (පියා/මව/පුතා/දුව/සහෝදරයන්/සහෝදරියන්) සිටීනම් එම ඥාතීත්වය සනාථ කළ හැකි ලේඛන හෝ පිටපත්

(10) අයදුම්කරුගෙන් යැපෙන්නන් සංඛ්‍යාව, අයදුම්කරු සතුව හෝ විවාහක නම් කලත්‍රයා සතු නිවාස ඉදිකිරීමට සුදුසු ඉඩම් ප්‍රමාණය හා ඔවුනට උරුම වීමට ඇති නිවාස ඉදිකිරීමට සුදුසු ඉඩම් පිළිබඳ විස්තර සඳහන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් ලබාදී ඇති සහතිකයක් (මෙම කරුණුවලට අදාළ සහතිකයක් ලබාදීමට සියලුම ග්‍රාම නිලධාරිවරුන් විසින් ක්‍රියා කළ යුතුය.)

**(පිටපත් සියල්ල සහතික කරන ලද ඒවා විය යුතුය.)**

*** ඉහත කරුණු අනුව ලකුණු ලබාදීම සඳහා මේ සමග හඳුන්වා දී ඇති ලකුණු සටහන් කිරීමේ පත්‍රය යොදාගත යුතුය.**